(121)

සෞ.ම.ලේ. 23/2022

BD/GH/CPHMA/1/2013
පළාත් මහ රෝහල,
බදුල්ල.
2022-07- 12

සියළුම කාර්ය මණ්ඩලය වෙත ,

## සෞඛ්‍ය කාර්ය මණ්ඩලයේ වාහන සඳහා ඉන්ධන අවසරපත් හා ඉන්ධන නිකුත් කිරීමේ ක්‍රමවේදය

වර්තමානයේ රටතුළ පවත්නා උග්‍ර ඉන්ධන අර්බුදය හේතුවෙන් සෞඛ්‍ය අමාත්‍යාංශය හා බලශක්ති අමාත්‍යාංශය එක්ව හදිසි හා අත්‍යවශ්‍ය සේවා පවත්වාගෙන යනු ලබන සෞඛ්‍ය වෘත්තිකයන් හට සේවයට වාර්තා කිරීම සඳහා ඔවුන්ගේ පෞද්ගලික වාහන සඳහා සෑම සිකුරාදා දිනයකම ඉන්ධන නිකුත් කිරීමේ වැඩ සටහනක් ක්‍රියාත්මක වේ. ඒ අනුව, බදුල්ල මිඩ්ල් ඊස්ට් ඉන්ධන පිරවුම්හල වෙත පෙට්‍රල් ඉන්ධන ලීටර් 6600 ක ඉන්ධන ලැබෙන අතර. එම ඉන්ධන තොගය බදුල්ල ප්‍රදේශයේ සියළු සෞඛ්‍ය ආයතන වෙනුවෙනි. ඒ අනුව, එම ඉන්ධන තොගය 2222 ක් වන රෝහල් කාර්ය මණ්ඩලය වෙතද ප්‍රමාණවත් නොවන අතර, මෙම ඉන්ධන කළමණාකරණය කර ගැනීම සඳහා ප්‍රධාන කාර්ය මණ්ඩලවල අංශ ප්‍රධාන නිලධාරින්ගේ නියෝජනයක්ද සහිතව ඉන්ධන මෙහෙයුම් කමිටුවක් මඟින් තීරණ ගැනීමට කටයුතු යොදා ඇත. ඒ අනුව ඉන්ධන මෙහෙයුම් කමිටුවේද නිර්දේශ අනුව ඉන්ධන බෙදාහැරීම අවසරපත් ක්‍රමයක් අනුව සතියකට නිකුත් කරන ඉන්ධන ප්‍රමාණය සීමා කිරිමට සිදුව ඇත. එළෙස සීමා කිරීමෙන් පසුව මසකට වරක්වත් එක් නිලධාරියෙකුට ඉන්ධන ලබා ගත හැකි බවට අපේක්ෂා කළ හැකිය. ඒ අනුව ඉන්ධන අවසරපත් නිකුත් කිරීම හා එම අවසරපත් සඳහා ඉන්ධන නිකුත් කිරීමේ ක්‍රමවේදය පහත පරිදි වේ.

### ඉන්ධන අවසරපත් නිකුත් කිරීම

01. බදුල්ල නගරයෙන් ඉන්ධන ලබා ගැනීමට අපේක්ෂා කරන රෝහල් කාර්ය මණ්ඩලයේ නිලධාරින්ගේ අයදුම්පත් අදාළ අංශ ප්‍රධානියාගේ නිර්දේශය සමඟ ප්‍රධාන කාර්යාලයට ලබාදෙන අනුපිළිවෙල අනුව, ලේඛනගත කොට, ලැබී ඇති අයදුම්පත් සංඛ්‍යාවේ ප්‍රමාණය අනුව, නිකුත් කිරීමට යෝජිත අවසරපත් සංඛ්‍යාව හා ඒ ඒ කාර්ය මණ්ඩලයෙන් ලැබී ඇති අයදුම්පත්වල සංඛ්‍යාවට සමානුපාතිකව අවසරපත් ප්‍රමාණය සාමාන්‍ය අගයකට ගණනය කර අවසරපත් නිකුත් කරනු ලැබේ. අවසරපත් නිකුත් කිරීමේදී නිලධාරියාගේ නමට හෝ කලත්‍රයාගේ නමට හෝ වාහනය ලියාපදිංචිව තිබිය යුතු අතර, ඒ බවට සනාථ කරන ලියවිලි (වාහන ලියාපදිංචි සහතිකය/රක්ෂණ කාඩ්පත/ආදායම් බලපත්‍රය) ඉදිරිපත් කර අවසරපත් ලබාගත යුතුය. දැනටමත් නිකුත් කර ඇති අවසරපත් සඳහා එම ලියවිලි ඉදිරිපත් කර යාවත්කාලීන කළ බවට දින මුද්‍රාවක් පාලන අංශයෙන් තබා ගත යුතුය.එම අවසරපතෙහි නිලධාරියාගේ නම, ජාතික හැඳුනුම්පත් අංකය,තනතුර,වාහන අංකය, ඉන්ධන වර්ගය හා ප්‍රමාණය සඳහන් කර ඇති අතර, එය පරිගණක ගත මුද්‍රණයක් වන අතර, එහි කිසිදු ඉලක්කමක්, අකුරක් හෝ වෙනස් නොකළ යුතුය.යම් හෙයකින් එහි යම් වැරදීමක් සිදුව ඇත්නම්, එම කාඩ්පත කාර්යාලයට භාරදී අළුතින් කාඩ්පතක් ලබා ගත යුතුවේ. කාඩ්පතක යම් වෙනස් කමක් සිදු කළහොත්, ඉන්ධන නිකුත් නොකරන අතර, ඒ සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු සිදු කළ හැකි බවද දැනුම් දෙමි. එක් නිලධාරියෙකුට එක් අවසරපතක් නිකුත් කරන අතර, ස්වාමිපුරුෂයා හෝ භාර්යාව සඳහාද එක් වාහනයකට හෝ දෙදෙනාගෙන් එක් අයෙකුට පමණක් එක් ඉන්ධන අවසරපත් නිකුත් කරනු ලැබේ. අදාළ අංශ ප්‍රධානී විසින් ඒ සම්බන්ධව පරික්ෂා කර බලා ඉන්ධන අවසරපත් සඳහා වූ අයදුම්පතෙහි නිර්දේශය සටහන් කළ යුතුවේ. දත්ත පද්ධතියේ යම් දෝෂයකින් හෝ අවසරපත් දෙකක් නිකුත්වුවහොත් එක් අවසරපතක් වහාම කාර්යාලයට භාර දිය යුතුවේ.

02. බදුල්ල නගරයේ ඉන්ධන පිරවුම්හලට අමතරව කැප්පෙටිපොල, බණ්ඩාරවෙල, මහියංගනය හෝ වෙනත් ඉන්ධන පිරවුම්හල්වලින් ඉන්ධන ලබා ගැනීමට අපේක්ෂා කරන්නේනම්, වාහනයේ අයිතිය තමාගේ හෝ කලත්‍රයාගේ බවට සනාථ කරන ලියවිලි සමහ ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතු අතර, එහි නම,තනතුර, ජාතික හැඳුනුම්පත් අංකය, වාහන අංකය, වාහනයේ වර්ගය හා අවශ්‍ය ඉන්ධන වර්ගය, අපේක්ෂිත ඉන්ධන පිරවුම්හල යනාදි විස්තර තිබිය යුතුය. ඒ අනුව, එක් නිලධාරියෙකුට එක් ඉන්ධන පිරවුම්හලකින් පමණක් ලබාගැනීමට අවස්ථාව සළසා දෙනු ලැබේ.

03. ඉන්ධන අවසරපත්වල තොරතුරු තමාගේ අයදුම්පතෙහි තොරතුරු සමහ නිවැරදිදැයි පරික්ෂා කොට කාර්යාලයෙන් භාර ගැනීමට කටයුතු කළ යුතුය.

04. අවසරපත් නැතිවූවහොත් නැවත අවසරපතක් නිකුත් නොකරන බැවින්, අවසරපත් ආරක්ෂා කොට තබා ගත යුතුය.

05. අවසරපත් නිකුත් කරනුයේ ඉන්ධන ලබා දීමට නියමිත සිකුරාදා දිනයට පෙර දින බ්‍රහස්පතින්දා දින වේ. එම ඉන්ධන අවසරපත් හෙද නිලධාරින් විසින් විශේෂ ශ්‍රේණියේ ප්‍රධාන හෙද නිලධාරි කාර්යාලයෙන්ද, කණිෂ්ඨ කාර්ය මණ්ඩලයේ අවසරපත් ප්‍රධාන රෝහල් ඔවසියර්ගෙන්ද, අනෙකුත් සියළු කාර්ය මණ්ඩලයේ අවසරපත් කාර්යාලයේ පාලන අංශයෙන්ද ලබා ගත යුතුය.

06. ඉන්ධන අවසරපත් නිකුත් කරන අයගේ මුල් නාම ලේඛනයක් සෑම බදාදා දිනයකම කාර්යාලයේ ප්‍රධාන දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කරනු ලබන අතර, එය අංශ ප්‍රධානීන්ගේ වට්ස්ඇප් ගිණුම් හරහාද ප්‍රදර්ශනය කෙරේ.

07. ඉන්ධන පිරවුම්හලට ඉන්ධන ලබාගැනීමට යාමේදී නිලධාරියාගේ වාහනය තමා විසින්ම රැගෙන යා යුතු අතර, රාජකාරි හැඳුනුම්පත හා ඉන්ධන අවසරපත් කාඩ්පතද රැගෙන යායුතුවේ.

08. ඉන්ධන අවසරපත් නිකුත් කරනුයේ ඉන්ධන ලබා ගැනීමට හැකි සීමිත සංඛ්‍යාවකට පමණි. ඒ අනුව ලීටර් 6600 ක ඉන්ධන බවුසරයක් පැමිණියහොත් හා එදින රෝහල් කාර්ය මණ්ඩලය වෙත ඉන්ධන ලීටර් 4000 ක්වත් ලැබුණහොත්, ඉන්ධන සීමා කිරිමක් සහිතව ලබාදුනහොත් රෝහල් කාර්ය මණ්ඩලයේ 400 ක් හෝ ඊට ආසන්න සංඛ්‍යාවකට උපරිම වශයෙන් එක් සතියකදී ඉන්ධන ලබා ගැනීමට හැකිවනු ඇත.

<u>ඉන්ධන නිකුත් කිරීමේ ක්‍රමවේදය</u>

01. ඉන්ධන නිකුත් කිරීමේ කටයුතුවල මෙහෙයුම් කාර්යයන් සඳහා ප්‍රධාන කාර්යාලයේ නිලධාරින්ගෙන් සමන්විත කණ්ඩායමක් පත් කර ඇති අතර, අනෙකුත් කාර්ය මණ්ඩල සාමාජිකයින් කිහිපදෙනෙකුට අවශ්‍යනම් නිරීක්ෂණ කටයුතු සඳහා රෝහල් අධ්‍යක්ෂගේ පූර්ව අවසරයක් ඇතිව සහභාගි විය හැකිය.

02. සෞඛ්‍ය කාර්ය මණ්ඩලයට ඉන්ධන නිකුත් කිරිම, යුධ හමුදා නිලධාරින්ගේ හා පොලිස් නිලධාරින්ගේ ආරක්ෂාව හා මෙහෙයවීම යටතේ සිදු කෙරේ.

03. ඉන්ධන නිකුත් කිරිම සඳහා ඉන්ධන පිරවුම්හල් පිවිසුමේදී කාර්යාලයේ ඉන්ධන නිකුත් කිරීමේ මෙහෙයුම් නිලධාරියෙකු විසින් ඉන්ධන අවසරපත් කාඩ්පත හා රාජකාරි හැඳුනුම්පත පරික්ෂා කර බලා

ඒක් වරකට ඒක් නිලධාරියෙකුගේ වාහනයක් බැගින් ඉන්ධන පිරවුම්හලට ඇතුළු කර ගනී. එම අවස්ථාවේදී ඉන්ධන අවසරපත් කාඩ්පත අදාළ නිලධාරි වෙත භාර දිය යුතුවේ.

04. කාර්ය මණ්ඩලයේ වැඩි පිරිසකට ඉන්ධන ලබා ගැනීමට හැකිවන සේ ඉන්ධන ප්‍රමාණයෙහි යම් සීමාවක් පනවා ඇති බැවින්, ඒම සීමාවට පමණක් ඉන්ධන නිකුත් කෙරේ.

05. ඉන්ධන ලබා ගත් නිලධාරියෙකුට නැවත ඉන්ධන ලබා ගැනීමට හැකිවන්නේ ඊට පසු ඉන්ධන අවසරපත් ලබාගත් සියළු නිලධාරින් ඉන්ධන ලබා ගැනීමෙන් පසු ඊළඟ වාරයේදීය.

06. ඊළඟ වාරයේදී ඉන්ධන අවසරපත් නිකුත් කරනුයේ අංශ ප්‍රධානින් මගින් වන අතර, පළමුවර ඉන්ධන අවසරපත් නිකුත් කරනු ලැබූ අයට දෙවන වාරයේදී මුල් වරට නැවත ඉන්ධන අවසරපත් ලබා දෙනු ලැබේ. සිකුරාදා දිනයට පෙර බදාදා දින සිට එම ඉන්ධන අවසරපත් නිකුත් කරනු ලැබේ. මුලින් ලැබූ අවසරපතම නැවත ආපසු ලබා දෙනු ලබන බැවින්, එම අවසරපත් ආරක්ෂා වන පරිදි අදාළ නිලධාරියා තබා ගැනීම සුදුසු වේ.

07. කිසියම් නිලධාරියෙකුට ඉන්ධන අවසරපත් දෙකක් මගින් හෝ වෙනයම් ආකාරයකින් ඉන්ධන ලබා ගෙන ඇති බව අනාවරණය වුවහොත් නැවත ඉන්ධන අවසරපත් නිකුත් නොකරන අතර, සීමිත ඉන්ධන ප්‍රමාණයන් සමස්ත කාර්ය මණ්ඩලයට ලබා ගැනීමට ඉඩ ලබා නොදී ඉන්ධන අයථා ලෙස ලබා ගැනීමට කටයුතු කිරීම, කූට ලේඛන සැකසීම ආදී වැරදි සම්බන්ධව විනයානුකූලව කටයුතු කළ හැකි බවද වැඩිදුරටත් දැනුම් දෙමි.

08. මෙම ක්‍රමවේදය අනුගමනය කිරීම, පවතින ඉන්ධන සීමාසහිතවීම නිසාම ගනු ලැබූ පියවර වන අතර, ප්‍රමාණවත් ඉන්ධන තොග ලැබුණු පසු මෙම ක්‍රමවේදය ඉවත් කරන බවද කාරුණිකව දැනුම් දෙමි.

09. මේ සම්බන්ධයෙන් ඔබ දක්වන සහයෝගය හා කැපවීම බෙහෙවින් අගය කරමි.

අධ්‍යක්ෂ
පළාත් මහ රෝහල
බදුල්ල

Dr. Upul Karunarathne
MBBS.MSc (Med.Admin). MD(Med.Admin)
Director
Provincial General Hospital
Badulla.

o/c

CSGNO - 8
H/O -
Notice board -
Telemedicine - web, message -
Con. ...
M. Center -
I